# උපාධි ප්‍රදානෝත්සවය 2009



## ගෞරවාර්හ කුලපති ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පණිවුඩය



රුහුණ විශ්වවිද්‍යාලයේ මේ වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවය මෙම දෙසැම්බර් මස 16 වන දින පැවැත්වේ. ඒ වෙනුවෙන් ආශිර්වාදාත්මක ප්‍රකාශයක් කරන්නට ලැබීම ගැන අතිශයින් ම සතුටු වෙමි. අවුරුදු තුනක් හෝ හතරක් තුළ දැනුම් සම්භාරයක් රැස් කරගෙන උපාධි සහතිකය ලබා විශ්වවිද්‍යාලයෙන් සමුගැනීමේ අවස්ථාව විශ්වවිද්‍යාලයට මෙන් ම උපාධිලාභීයාටත් ඔවුන්ගේ දෙමාපිය සොහොයුරු ආදීන්ටත් අමතක නොවන වැදගත් සිද්ධියකි.

මෙසේ උපාධිධාරියෙකු තැනීම සඳහා රජය විශාල මුදලක් වැයකළේ කුමක් සඳහා දැයි විමසා බැලිය යුතු ය. යමෙකුගේ සහජ හැකියාවන් හඳුනාගෙන එය දීප්තිමත් වන අන්දමින් ඉගෙනීම ලබාදීම රජයේ යුතුකමකි. ඔහුගෙන් සමාජයේ ප්‍රගතියට අවශ්‍ය සහයෝගය ලබාගැනීම යුක්ති සහගත යි. සැම කෙනෙකුට ම යහතින් ජීවත්වීම සඳහා උගත්කමට සුදුසු රැකියාවක් තිබිය යුතු ය. එහෙත් විශ්වවිද්‍යාලය යනු රැකියා ලබාදීමේ ආයතන නොවේ. විශ්වවිද්‍යාලයීය උපාධිධාරියා දැනුමෙන් පිරිපුන්, ආධ්‍යාත්මික ගුණවගාවෙන් සමන්විත, මානව හිතවාදී යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ අවබෝධයක් ඇති පුද්ගලයෙකු විය යුතු යි. එහෙත් වර්තමාන සමාජයේ අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳව නම් පවතින්නේ ඛේදනීය ස්වභාවයකි. බොහෝවිට ගැටුම් ඇතිවන්නේ එබැවිනි.

මේ පිළිබඳ ව 2003 උපාධි ප්‍රදානෝත්සව දේශනය පැවැත්වූ මහාචාර්ය එම්. ඩී. වී. පීරිස් මහතාගේ අදහස මෙසේ සඳහන් වී තිබිණි. මේ කොටස ඉදිරිපත් කොට මේ කෙටි ලිපිය අවසන් කිරීමට කල්පනා කරමි.

**“එවකට යුනෙස්කෝ ආයතනයේ ප්‍රධාන අධ්‍යක්ෂ තනතුර හෙබ වූ ජූලියන් හක්ස්ලි සූරීන් වෙත 1947 ජූනි 23 වැනි දාතමින් යැවූ ලිපියකින් මහත්මා ගාන්ධි මෙසේ පවසයි. අකුරු නොදත් එහෙත් බුද්ධිමත් මාගේ මවුගෙන් යුතුකම් මනා සේ ඉටු කිරීමෙන් සතු කර ගත යුතු වූත් ආරක්ෂා කර ගත යුතු වූත් අයිතිවාසිකම් යමෙකුට අත්පත්වන බව මම ඉගෙන ගතිමි. පිරිමි ගැහැණු වශයෙන් යුතුකම් හඳුනාදීමටත් හැම අයිතිවාසිකමක් ම යම් හෝ යුතුකමක් හා සම්බන්ධ කිරීමටත් සැබවින් ම පහසු ය. ඒ අතර මුලින් ඉටුකළ යුත්තේ යුතුකම් ය. ඉක්බිති ව යම් අයිතිවාසිකමක් ඉතුරු වේ නම් එය ඒ සඳහා යටත් කිරීමට පවා සුදුසු නැති ප්‍රමාණයේ එකකි”.**

අද අපේ රට ත්‍රස්තවාදයෙන් නිදහස් කරගත් ඒකීය රාජ්‍යයකි. තිස් අවුරුදු ශාපයෙන් නිදහස දිනා ගැනීමෙන් පසු ව සැම අතින් ම සම්පූර්ණ රටක් නිර්මාණය කරගැනීමේ මහා ව්‍යාපාරයට උරදීම අපේ මේ විශ්වවිද්‍යාලයෙන් පිට වී යන උපාධිලාභීන්ගේ අධිෂ්ඨානය විය යුතු ය.

ඔබ සැමට යහපතක් ම වේවා

රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති, ශ්‍රී රෝහණ පාර්ශ්වයේ මහානායක,
රාජකීය පණ්ඩිත සාහිත්‍යසූරී
මහෝපාධ්‍යාය
**අත්තුඩාවේ සිරි රාහුල ස්ථවිර**
2009.12.16

## උපකුලපතිතුමාගේ පණිවුඩය



රුහුණ විශ්වවිද්‍යාලයේ 2009 සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවයේ උපාධිලාභීන් වෙත මෙම පණිවිඩය නිකුත් කරනුයේ ඉමහත් සතුටිනි. විශ්වවිද්‍යාලයක දින දර්ශනයේ ඉතාමත් වැදගත් උත්සවය උපාධි ප්‍රදානෝත්සවය වේ. එහි සම්මානනීය විභූතිය මඟින් විශ්වවිද්‍යාල උපාධියක් පිරිනැමීමේ මහත් වූ සංවිපාකය ප්‍රකාශයට පත්වේ. එමඟින් උපාධිලාභීන් ඔවුන්ගේ ජීවිතයේ නිශ්චයාත්මක සන්ධිස්ථානයකට එළඹ සිටින බව ඇඟවෙයි.

අපි, අපගේ රටෙහි අද්‍යතන ඉතිහාසයේ තීරණාත්මක කාල පරිච්ඡේදයක් ගෙවමින් සිටින්නෙමු. වසර තිහක් පුරා පැවති අතිශය විනාශකාරි හා කරදරකාරී සිවිල් යුද්ධය අවසන් වී සංක්‍රාන්ති කාල පරිච්ඡේදයක් ගෙවමින් සිටින්නෙමු. අපි ජාතිය ගොඩ නැඟීමේ කාල පරිච්ඡේදයකට යොමු වෙමින් සිටින්නෙමු. එම වැදගත් කාර්යයට අයත් වනුයේ, යුද්ධයෙන් විනාශ වූ කොන්ක්‍රීට් ව්‍යුහයන් නැවත ගොඩ නැඟීම පමණක් නොවේ. අපගේ අභ්‍යන්තර අස්මිතා නැවත ගොඩ නැඟීම, විවිධත්වය තුළ සමගියේ නව මං පෙත් ගොඩ නැගීම හා ජාතීන් අතර අන්‍යෝන්‍ය විශ්වාසයේ හා අවබෝධයේ නව යුගයක් පුබුදු කිරීම ද සිදු කළ යුතුය. අප වටා ගොඩනැඟෙමින් සිටින ජාත්‍යන්තර හා බහු ජාතික නියෝජිතයන්ගේ පීඩනය සමඟ බිහි වන අප්‍රමාණ අභියෝගයන්ට අපි මුහුණ දෙමින් සිටින්නෙමු. අප සතු ව ඇති සියලුම සමාජීය, ආර්ථික, සංස්කෘතික හා ආධ්‍යාත්මික සම්පත් යොදා ගනිමින් මෙම අභියෝගවලට මුහුණ දීමත්, එමඟින් සාමයට ලැදි ජනතාවක් වශයෙන් අපගේ ප්‍රතිරූපය නැවත ගොඩනඟා ගැනීමත් කළ යුතු ව තිබේ. මෙම තීරණාත්මක මොහොතේ දී ඔබගේ උපරිමය රටට ලබාදීම අවශ්‍ය ව ඇත. මෙම අත්‍යවශ්‍ය ජාතික කාර්යයේ දී ඊට දායකත්වය ලබා දීමට ඔබ සූදානම් බවට ඔබ සහතික විය යුතු ය.

රුහුණ විශ්වවිද්‍යාලයේ 2009 සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය පවත්වන්නේ එවන් සන්දර්භයක් තුළ ය. ඔබ විසින් තෝරා ගත්තා වූ අධ්‍යයන ක්ෂේත්‍රවල යම් ශක්‍යතා ලබාගත් බවට සහතික ලද ඔබ, අපගේ ඉතිහාසයේ මෙම මොහොතේ වැදගත්කම වටහා ගත යුතු ය. ඔබෙන් ඉටුවිය යුතු වැදගත් කාර්යභාරයන්, යුතුකම් හා වගකීම් වටහා ගත යුතු ය. එය කළ යුත්තේ රුහුණ විශ්වවිද්‍යාලයේ උපාධිලාභීන් ලෙස පමණක් නොව මෙම රටෙහි වෙසෙන සවිඥානක පුරවැසියන් ද වශයෙනි. උපාධි ප්‍රදානෝත්සවය යනු ශාස්ත්‍රෝද්ග්‍රහණයේ නිමාව” සනිටුහන් කරන්නක් නොවන බව ඔබ වටහා ගෙන ඇති බව නිසැක ය. උපාධි ප්‍රදානෝත්සවයෙන් සනිටුහන් වන්නේ යාව ජීව ශාස්ත්‍රෝද්ග්‍රහණයේ” ඇරඹුම ය. ශාස්ත්‍රෝද්ග්‍රහණය, විෂය නිර්දේශයකට හෝ පාඨමාලාවකට හෝ මොඩියුලයකට හෝ සීමා කළ හැකි දෙයක් නොවේ. එය දිවියේ හා දිවි පැවැත්මේ හරය වේ. එය ජීවිතයේ සත්‍ය වූ අත්දැකීම් තුළින් බිහිවන්නකි.

ඔබ හොඳින් ශාස්ත්‍රෝද්ග්‍රහණය කරන්නට ඇතැයි මම විශ්වාස කරමි. ඔබ පොත්-පත්, මිනිසුන් ගැන මෙන් ම ක්‍රීඩා මඟින් ජීවිත හර පද්ධතියක් ගැන ද ඉගෙන ගන්නට ඇත. පංති කාමරයේ දී හා පුස්තකාලයේ දී ද, පොදු කාමරයේ දී හා ආපනශාලාව තුළ දී ද, ක්‍රීඩා පිටියේ දී ද වැදගත් පාඩම් ඉගෙන ගන්නට ඇතැයි සිතමි.

මෙම අවස්ථාව වන විට ඔබ දැනුම හා කුශලතා පමණක් නොව ආකල්ප ද අත් කර ගෙන තිබිය යුතු ය. බොහෝ විට සමහර සිසුන්ට විශ්වවිද්‍යාල පරිසරය යනු සාමාන්‍ය සමාජයෙන් බාහිර වූ ද, ඊට හාත්පසින් ම වෙනස් වූ නීති රීති මඟින් පාලනය වන්නා වූ ද ආයතනයක් යන හැඟීම ඇත. මේ නිසා සිසුන් තුළ බාහිර ලෝකයේ පවත්නා යථාරූප ජීවිතයට සූදානම් නොවූ අභූත හැඟීම්වලින් යුත් මානසික තත්ත්වයක් ඇතිවේ. අවසාන විශ්ලේෂණයේ දී, ඔබගේ ජීවිතයේ සාර්ථකත්වය තීරණය කරන සාධකය ඔබගේ ආකල්ප වේ. තාවකාලික හා ක්ෂණික වාසි හෝ සුළු ප්‍රතිලාභවලින් දූෂිත නොවූ පිරිසිදු දර්ශනයක් සහිතව ඕනෑ ම ආපත්තියකට මුහුණ දිමේ ශක්තිය හා ධෛර්යය ඔබට ලැබෙන්නේ ඔබගේ සිතට කා වැදුණ සදාචාරාත්මක හා ආචාරශීලී මූලධර්ම මඟිනි.

ඔබගේ ජීවිතයේ ඉදිරි වර්ෂවල දී ඔබට ආපත්ති හා අභියෝග විශාල ප්‍රමාණයකට මුහුණ දීමට සිදුවනු ඇත. ඔබට ධෛර්ය සම්පන්න ව හා ස්ථිරසාර ලෙස ඒවාට මුහුණ දී, ජයගෙන ඔබගේ ජීවිතය සාර්ථක කර ගැනීමට සිදුවනු ඇත.

ඔබට සාර්ථක, ආහ්ලාදජනක හා ප්‍රීතිමත් කාල හිමිවනු ඇත. යහපත් හා සෞභාග්‍ය කාල පරිච්ඡේද නිහතමානී ව හා උපේක්ෂාවෙන් බාර ගැනීමට ඔබ ඉගෙන ගත යුතු ය.

ඔබගේ ජීවිතයේ නව පරිච්ඡේදයක් ඇරඹෙන මේ මොහොතේ මම ඔබට සියලු ජයග්‍රහණ පතමි. ඵලදායක හා ඉෂ්ටඵලදායී ජීවිතයක් පතමි.

මහාචාර්ය සුසිරිත් මෙන්ඩිස්
උපකුලපති
2009 දෙසැම්බර් 16

## සම්මාන උපාධිලාභීහු

### සාහිත්‍යසූරී - අචාර්ය හිරාන් වසන්ත ජයවර්ධන



අචාර්ය හිරාන් ජයවර්ධන මහතා අධිනීතිඥවරයෙකු වන අතර ඔහු අන්තර්ජාතික නීතිය පිළිබඳ විශේෂඥයෙකි. තුන්වන එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ සාගර නීතිය සඳහා වන සැසියට ශ්‍රී ලංකා නියෝජිත මණ්ඩලයේ ප්‍රධානියා ලෙසත්, විශේෂ නියෝජිතයෙකු ලෙසත් කටයුතු කරමින් මහද්වීපික සීමා නිර්ණය කිරීමේ දී ශ්‍රී ලංකාවට අයත් සාගර වපසරිය දෙගුණයක් දක්වා වැඩිකර ගැනීමට හැකිවිය. එම විශිෂ්ට සේවය අගය කිරිමක් ලෙස රුහුණ විශ්වවිද්‍යාලය විසින් සාහිත්‍යසූරී ගෞරව උපාධිය පිරිනමනු ලබයි.

### විද්‍යාසූරී - මහාචාර්ය ඩිට්රිච් මයියර්



මහාචාර්ය ඩිට්රිච් මයියර් මහතා ජර්මනියේ මහාචාර්යවරයෙකි, ඔහු විශිෂ්ට ජල විශේෂඥයෙකු මෙන්ම ප්‍රජා සේවකයෙකි. වෙරළාසන්න ප්‍රදේශයේ පානීය ජල ගැටලු විසඳීම සඳහා 2005 වසරේ සිට රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සමඟ සහයෝගයෙන් පර්යේෂණ සිදුකරයි. මහාචාර්ය මයියර් මහතා ජර්මනියේ ජනතාව අතර අප විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය නැංවීමට කටයුතු කිරීම අගය කිරීමක් ලෙස රුහුණ විශ්වවිද්‍යාලය විසින් විද්‍යාසූරී ගෞරව උපාධිය පිරිනමනු ලබයි.